# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2376/25 - 2024 මාර්තු මස 21 වැනි බ්‍රහස්පතින්දා - 2024.03.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2017 අංක 24 දරන දේශීය ආදායම් පනත**

123 (8) වගන්තිය යටතේ වන නියෝගය

2023 අංක 4 දරන දේශීය ආදායම් (සංශෝධන) පනතින් සංශෝධිත 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ (මෙහි මින් මතු දේශීය ආදායම් පනත යනුවෙන් සඳහන් වේ.) 123 වැනි වගන්තියේ (8) වැනි උපවගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් අමාත්‍ය, රනිල් වික්‍රමසිංහ වන මා විසින් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් (මෙහි මින්මතු දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් යනුවෙන් සඳහන් වේ.) වෙත නිතිපතා ලබාදිය යුතු තොරතුරු මෙම නියෝගය මඟින් නියම කරනු ලැබේ. දේශීය ආදායම් පනත මගින් විධිවිධාන සලසා ඇති පරිදි වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද එය නොතකා, මෙම නිවේදනයේ II වැනි උපලේඛනයේ කොන්දේසිවලට යටත්ව, රජයේ ආයතන ඇතුළු තැනැත්තන් විසින් මෙහි I වැනි උපලේඛනය මඟින් නියම කර ඇති තොරතුරු දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ලබාදිය යුතුය.

මෙම නිවේදනය 2024 අප්‍රේල් 01 වැනිදා සිට ක්‍රියාත්මක වේ.

**රනිල් වික්‍රමසිංහ,**
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ
ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය.

2024 ක් වූ මාර්තු මස 21 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ දී ය.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## උපලේඛනය I

(1) රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් අන්තර්ජාලගත වේදිකාවක් මගින් හෝ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් අනුමත කරන ලද වෙනත් යම් ඉලෙක්ට්‍රොනික වේදිකාවක් මගින් හෝ පහත සඳහන් තොරතුරු මාසිකව ලබාදිය යුතුය:-

(අ) පැවරුම් ඇතුළුව ලියාපදිංචි කළ ඉඩම්වල/දේපළවල අයිතිය හෝ හිමිකම හෝ පිළිබඳ තොරතුරු ෘ

(i) අයිතිකරුගේ/අයිතිකරුවන්ගේ හෝ හිමිකම දරන්නාගේ/දරන්නන්ගේ නම/නම් ;

(ii) හිමිකම් දරන්නාගේ/දරන්නන්ගේ ජාතික හැඳුනුම්පත් අංකය/අංක, විදේශ ගමන් බලපත් අංකය/අංක, සමාගම් රෙජිස්ට්‍රාර් අංකය/අංක (මෙම නිවේදනයේ මින් මතු ජා.හැ. අං./වි.ග.බ. අං./ස.රෙ. අං. ලෙස සඳහන් කරනු ලැබේ.) ;

(iii) පැවරුම් වර්ගය ;

(iv) විකිණීමක් සම්බන්ධයෙන් වන විට -

(ivඅ) විකුණුම්කරුගේ/විකුණුම්කරුවන්ගේ නම/නම් ;

(ivආ) විකුණුම්කරුගේ/විකුණුම්කරුවන්ගේ ජා.හැ. අං./වි.ග.බ. අං./ස.රෙ. අං.

(v) ඉඩම/දේපළ පිහිටි ස්ථානය ;

(vi) අයිතිය/හිමිකම පිළිබඳ ලියවිල්ලට අනුව ඉඩමේ / දේපළේ වටිනාකම ;

(vii) නොතාරිස්ගේ නම ;

(viii) නොතාරිස්ගේ ජාතික හැඳුනුම්පත් අංකය ;

(ආ) ලියාපදිංචි කළ බදු ගිවිසුම් පිළිබඳ තොරතුරු ෘ

(i) බදුකරුගේ/බදුකරුවන්ගේ නම/නම් ;

(ii) බදුකරුගේ/බදුකරුවන්ගේ ජා.හැ අං./වි.ග.බ. අං./ස.රෙ. අං.

(iii) බදු දෙන්නාගේ/බදු දෙන්නන්ගේ නම/නම් ;

(iv) බදු දෙන්නාගේ/බදු දෙන්නන්ගේ ජා.හැ. අං./වි.ග.බ. අං./ස.රෙ. අං.

(v) දේපළේ ලිපිනය ;

(vi) බදු ගිවිසුමේ දිනය ;

(vii) බදු වටිනාකම ;

(viii) බදු කුලී ;

**(2)** සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් අන්තර්ජාලගත වේදිකාවක් මගින් හෝ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් අනුමත කරන ලද වෙනත් යම් ඉලෙක්ට්‍රොනික වේදිකාවක් මගින් හෝ පහත සඳහන් තොරතුරු තථ්‍ය කාල පදනම මත ලබාදිය යුතුය :-

(අ) ලියාපදිංචි සමාගම් පිළිබඳ තොරතුරු -

(i) සමාගම් රෙජිස්ට්‍රාර් අංකය ;

(ii) සමාගමේ නම ;

(iii) සංස්ථාගත කළ දිනය ;

(iv) සමාගමේ ලිපිනය ;

(v) ප්‍රාග්ධන තොග වටිනාකම;

(vi) අධ්‍යක්ෂගේ/අධ්‍යක්ෂවරුන්ගේ නම/නම් ;

(vii) අධ්‍යක්ෂගේ/අධ්‍යක්ෂවරුන්ගේ ජාතික හැඳුනුම්පත් අංකය/විදේශ ගමන් බලපත් අංකය ;

(ආ) කොටස් හිමියන් පිළිබඳ තොරතුරු -

(i) සමාගම් රෙජිස්ට්‍රාර් අංකය ;

(ii) සමාගමේ නම ;

(iii) සමාගමේ ලිපිනය ;

(iv) ප්‍රාග්ධන තොග වටිනාකම ;

(v) කොටස්හිමියාගේ/කොටස්හිමියන්ගේ නම/නම් ;

(vi) කොටස්හිමියාගේ/කොටස්හිමියන්ගේ ජා.හැ. අං./වි.ග.බ. අං./ස.රෙ. අං.

(vii) කොටස්හිමියාගේ/කොටස්හිමියන්ගේ ලිපිනය/ලිපිනයන් ;

(viii) සමාගමේ කොටස් සඳහා සහභාගිත්වය ;

(ඇ) කොටස්වල මාරුවීම පිළිබඳ තොරතුරු -

(i) කොටස් නිකුත් කිරීම ;

(ii) කොටස් පැවරීම් ;

(iii) මාරුවන දිනය ;

(iv) කොටස්හිමියාගේ නම ;

(v) කොටස්හිමියාගේ ලිපිනය ;

(ඇ) සමාගමේ නම කපා හැරීම පිළිබඳ තොරතුරු -

(i) සමාගම් රෙජිස්ට්‍රාර් අංකය ;

(ii) සමාගමේ නම ;

(iii) නම කපා හැරීමේ දිනය ;

(iv) සමාගමේ ලිපිනය ;

**(3)** මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්වරයා විසින් අන්තර්ජාලගත වේදිකාවක් මගින් හෝ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් අනුමත කරන ලද වෙනත් යම් ඉලෙක්ට්‍රොනික වේදිකාවක් මගින් හෝ පහත සඳහන් තොරතුරු තථ්‍ය කාල පදනම මත ලබාදිය යුතුය.

(අ) ලියාපදිංචි කළ වාහන පිළිබඳ තොරතුරු -

(i) අයිතිකරුගේ නම/නම් ;

(ii) අයිතිකරුගේ/අයිතිකරුවන්ගේ ජා.හැ.අං./වි.ග.බ. අං./ස.රෙ. අං. ;

(iii) වාහනයේ ලියාපදිංචි අංකය (අංක තහඩුවේ සඳහන් අංකය) ;

(iv) ලියාපදිංචි කළ දිනය ;

(v) වාහනයේ වර්ගය ;

(ආ) වාහන හිමිකම් පැවරීම පිළිබඳ තොරතුරු-

(i) විකුණුම්කරුගේ/විකුණුම්කරුවන්ගේ නම් ;

(ii) විකුණුම්කරුගේ/විකුණුම්කරුවන්ගේ ජා.හැ. අං./වි.ග.බ. අං./ස.රෙ. අං. ;

(iii) ගැනුම්කරුගේ නම ;

(iv) ගැනුම්කරුගේ ජා.හැ. අං./වි.ග.බ. අං./ස.රෙ. අං. ;

(v) වාහනයේ ලියාපදිංචි අංකය (අංක තහඩුවේ සඳහන් අංකය) ;

(vi) හිමිකම පැවරීමේ දිනය ;

(vii) වාහනයේ වර්ගය ;

**(4)** භාණ්ඩ, වැඩ හෝ උපදේශන හා උපදේශන නොවන සේවාවන් සැපයීම සඳහා ඕනෑම රජයේ ආයතනයක කොන්ත්‍රාත් ලබාදීම භාරව සිටින නිලධාරීන් විසින් පරිශීලක අතුරු මුහුණත (User Interface) හරහා මාසිකව පහත සඳහන් තොරතුරු ලබාදිය යුතුය.

(අ) ගිවිසුම් පිළිබඳ තොරතුරු -

(i) ගිවිසුම්ගත පාර්ශ්වකරුවන්ගේ නම/නම් ;

(ii) ගිවිසුම්ගත පාර්ශ්වකරුවන්ගේ ජා.හැ. අං./වි.ග.බ. අං./ස.රෙ. අං. ;

(iii) ගිවිසුම්ගත පාර්ශ්වකරුවන්ගේ බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංක ;

(iv) ගිවිසුමේ ස්වභාවය ;

(v) ගිවිසුමේ දිනය ;

(vi) ගිවිසුමේ වටිනාකම ;

(vii) අවසන් කරන දිනය ;

(viii) ගෙවීම් සඳහා සාක්ෂි ;

(ආ) භාණ්ඩ/වැඩ/සේවා පිළිබඳ තොරතුරු -

(i) භාණ්ඩ/වැඩ/සේවාවල ස්වභාවය ;

(ii) භාණ්ඩ/වැඩ/සේවාවල භාර දෙන දිනය ;

(iii) සපයන/භාරදෙන ස්ථානය ;

(iv) භාණ්ඩවල ප්‍රමාණය සහ ගුණත්වය ;

**(5)** බැංකු සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියාමනය කරන බැංකු නොවන මූල්‍ය ආයතන ද ඇතුලත්ව ඕනෑම මූල්‍ය ආයතනයක් විසින් අන්තර්ජාලගත වේදිකාවක් මගින් හෝ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් අනුමත කරන ලද වෙනත් යම් ඉලෙක්ට්‍රොනික වේදිකාවක් මගින් හෝ පහත සඳහන් තොරතුරු කාර්තුමය පදනම මත ලබාදිය යුතුය .-

(අ) සියළුම ජංගම ගිණුම් පිළිබඳ තොරතුරු -

(i) බද්ධ ගිණුම් ඇතුළුව ගිණුම් හිමියාගේ/හිමියන්ගේ නම/නම් ;

(ii) ගිණුම් අංකය ;

(iii) ගිණුම් හිමියාගේ/හිමියන්ගේ ලිපිනය/ලිපිනයන් ;

(iv) ගිණුම් හිමියාගේ/හිමියන්ගේ ජා.හැ. අං./වි.ග.බ. අං./ස.රෙ. අං. හෝ ශ්‍රී ලංකා මහ බැංකුවේ මාර්ගෝපදේශවල සඳහන් පරිදි පවත්වාගෙන යනු ලබන අනන්‍ය අංකය (Unique Number) ;

(v) 2024 ජූලි 01 දින හෝ ඊට පසුව විවෘත කරනු ලබන ගිණුම් සඳහා බදු ගෙවන්නා හඳුනා ගැනීමේ අංකය ;

(vi) කාර්තුව අවසන් වන දිනට ශේෂය ;

(vii) කාර්තුවේ හර සහ බැර සටහන්වල මුළු එකතුව ;

(ආ) ණය හා අත්තිකාරම් පිළිබඳ තොරතුරු -

(i) ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයට ඉදිරිපත් කරන හෝ ඉදිරිපත් කිරීමට අවශ්‍ය සියලුම තොරතුරු ;

(ii) උකස් හා රන් ණය, මුදල් මත සුරැකුම් ණය (cash-back loans) හෝ තැන්පතු මත සුරැකුම් ණය (deposit-backed loans) ඇතුළු මූල්‍ය ආයතන විසින් ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය වෙත තොරතුරු සපයනු නොලබන අනෙකුත් ණය හා අත්තිකාරම් සඳහා අයිතම (i) හි සඳහන් එවැනි තොරතුරු ;

**(6)** කොළඹ කොටස් හුවමාරුවේ සභාපති විසින් අන්තර්ජාලගත වේදිකාවක් මගින් හෝ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් අනුමත කරන ලද වෙනත් යම් ඉලෙක්ට්‍රොනික වේදිකාවක් මගින් හෝ පහත සඳහන් තොරතුරු කාර්තුමය පදනම මත ලබාදිය යුතුය:-

(අ) ආයෝජනාවලිය පිළිබඳ තොරතුරු -

(i) ආයෝජකයාගේ/ආයෝජකයන්ගේ නම/නම් හා ජා.හැ. අං./වි.ග.බ. අං./ස.රෙ. අං. ;

(ii) ආයෝජකයාගේ/ආයෝජකයන්ගේ බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකය/අංක ;

(iii) කොටස් සංඛ්‍යාව ;

(iv) කාර්තුව අවසානයේ දී කොටස් වටිනාකම ;

(v) ආයෝජනාවලියේ වටිනාකම ;

(vi) මිලදී ගත් දිනය ;

(vii) ප්‍රතිග්‍රහණ වටිනාකම ;

(viii) කූපන/සලාක වටිනාකම් ;

(ix) කොටස් වර්ගය සහ/හෝ ගනුදෙනු කළ හැකි නීත්‍යානුකූල සාධන පත්‍රය.

(ආ) කොටස් ගනුදෙනු සහ වෙනත් ගනුදෙනු කළ හැකි සාධන පත්‍ර පිළිබඳ තොරතුරු -

(i) විකුණුම්කරුගේ/විකුණුම්කරුවන්ගේ සහ ගැනුම්කරුගේ/ගැනුම්කරුවන්ගේ නම/නම් ;

(ii) විකුණුම්කරුගේ/විකුණුම්කරුවන්ගේ සහ ගැනුම්කරුගේ/ගැනුම්කරුවන්ගේ ජා.හැ. අං./වි.ග.බ. අං./ස.රෙ. අං. ;

(iii) විකුණුම්කරුගේ/විකුණුම්කරුවන්ගේ සහ ගැනුම්කරුගේ/ගැනුම්කරුවන්ගේ බදු ගෙවන්නා හඳුනා ගැනීමේ අංකය/අංක ;

(iv) ගනුදෙනු කළ කොටස් හෝ සාධන පත්‍ර සංඛ්‍යාව ;

(v) ගනුදෙනුවේ වටිනාකම ;

(vi) ගනුදෙනු කළ දිනය ;

(vii) සාධන පත්‍රයේ/පත්‍රවල වර්ගය ;

## උපලේඛනය II

1. I වන උපලේඛනය අනුව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ලැබෙන තොරතුරු දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ආදායම් පරිපාලන හා කළමනාකරණ තොරතුරු පද්ධතියේ (RAMIS) අවදානම් මොඩියුලයට ඇතුළත් කළ යුතුය.

2. I වන උපලේඛනයේ 5 වන හා 6 වන ඡේදවල සඳහන් තැනැත්තන් විසින් එක් එක් අදාළ කාර්තුව අවසානයට පසුව එළඹෙන මාසයේ විසිවන දින හෝ ඊට පෙර සෑම කාර්තුවක් සඳහාම වන සියලු තොරතුරු ලබාදිය යුතුය.

3. යම් තැනැත්තකු හෝ රජයේ ආයතනයක් විසින් මෙම නිවේදනයේ දිනට පෙර යම් තොරතුරක් පවත්වාගෙන ගොස් නොමැති නම්, 2024 ජූලි 01 වනදා සිට එම තොරතුරු පවත්වාගෙන යාම ආරම්භ කළ යුතු අතර එදින සිට ක්‍රියාත්මක වන පරිදි එම තොරතුරු සම්බන්ධයෙන් මෙම නිවේදනයට අනුකූලව කටයුතු කළ යුතුය.

4. දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් I වන උපලේඛනය යටතේ තොරතුරු ඉදිරිපත් කිරීම ආරම්භ කළ යුතු දිනය යම් තැනැත්තකු හෝ රජයේ ආයතනයක් වෙත ලිඛිත නිවේදනයක් මගින් හෝ ප්‍රසිද්ධ නිවේදනයක් මගින් හෝ දැනුම්දිය යුතුය.

5. මෙම නිවේදනයේ කාර්යයන් සඳහා -

(අ) "ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය" යනු 1990 අංක 18 දරන ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශ පනත යටතේ ස්ථාපිත ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයයි.

(ආ) "මූල්‍ය ආයතන" සඳහා දේශීය ආදායම් පනත මගින් ලබාදුන් අර්ථයම පවතිනු ඇත.

(ඇ) "රජයේ ආයතන" යනු යම් දෙපාර්තමේන්තුවක් හෝ ශ්‍රී ලංකා ආණ්ඩුවේ යම් ව්‍යාපාරයක් වන අතර ඕනෑම රජයේ සංස්ථාවක් එයට ඇතුළත් වේ.

(ඈ) "තැනැත්තා" සඳහා දේශීය ආදායම් පනත මගින් ලබාදුන් අර්ථයම පවතිනු ඇත.

(ඉ) "කාර්තුව" යනු ඕනෑම වර්ෂයක ජනවාරි, අප්‍රේල්, ජූලි හෝ ඔක්තෝබර් පළමුවැනි දිනෙන් ආරම්භ වන මාස තුනක කාල සීමාව වේ.

EOG 03 - 0169

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.